**ශීර්ෂය 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.**

**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

---

(අ) ව්‍යවස්ථාපිත අණපනත් මඟින් පැවරී ඇති බලතල හා වගකීම් ඉටු කිරීම .

(ආ) රජයේ ප්‍රධාන සංවර්ධන වැඩ සටහන් හා සංවර්ධන ව්‍යාපෘති (සමෘද්ධි හා විමධ්‍යගත වැඩ සටහන්) රජයේ නියමයන්, උපදෙස් හා මඟපෙන්වීම් වලට අනුකූල වන පරිදි ක්‍රියාවට නැංවීම සහතික කිරීම.

(ඇ) දිස්ත්‍රික්කයේ සියළුම රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන මඟින් ජනතා අභිවෘද්ධිය සඳහා ඉටු කරනු ලබන සංවර්ධන වැඩ සටහන් හා පරිපාලන කටයුතු යථාවත් පරිදි ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සමායෝජනය, සම්බන්ධීකරණය හා මඟපෙන්වීම.

(ඈ) ආණ්ඩුවේ දිස්ත්‍රික් නියෝජිතයා ලෙස කටයුතු කිරීම.

(ඉ) ස්වභාවික හා වෙනත් ව්‍යසන හා ආපදා, දිස්ත්‍රික්කය තුල ඇති වූ අවස්ථා වලදී ප්‍රායෝගිකව මැදිහත් වී කටයුතු කිරීම.

1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්රාදේශිය ලේකම් කාර්යාල .

---

(අ) තමන්කඩුව

(ආ) හිඟුරක්ගොඩ .

(ඇ) මැදිරිගිරිය

(ඈ) ලංකාපුර

(ඉ) දිඹුලාගල

(ඊ) වැලිකන්ද

(උ) ඇලහැර

1.3 විගණන විෂය පථය

---

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ

ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 20 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.5 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය මෙහි (අ) සිට ( ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| කාර්යාලය | ලේඛන වර්ගය | අදාල රෙගුලාසි | නිරික්ෂණය |
|---|---|---|---|
| තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අත්තිකාරම් ලේඛණය | මු.රෙ.371 | පවත්වා නොතිබුණි. |
| දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | පරිගණක සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය | 2012 නොවැම්බර් 31 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ස්ථාවර වත්කම් ලේඛනය | මුදල් රෙගුලාසි 03 උපලේඛනයේ අංක 287 ආකෘතිය | පවත්වා නොතිබුණි. |
| දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | පොදු 58 ආකෘතියේ මුදල් පොත | 2013 නොවැම්බර් 18 දිනැති අංක 04/2013 දරන චක්‍රලේඛයේ 01 ජේදය | පවත්වා නොතිබුණි. |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්ගේ පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 පරිච්ඡේදය | පවත්වා නොතිබුණි. |
| වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | නිවාඩු ලේඛනය | ආයතන සංග්‍රහයේ xii වැනි පරිච්ඡේදයේ 1.7 උප වගන්තිය | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | පැමිණීමේ ලෙඛනය | ආයතන සංග්‍රහයේ xxiii වැනි පරිච්ඡේදයේ 1.3 උප වගන්තිය | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අලිවෙඩි ලැබීම හා නිකුත් කිරිම් පිළිබද ලේඛනය | මු.රෙ. 445(2) | යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | විශ්‍රාමිකයින්ගේ ලේඛනය | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල්ගේ 2009 ජුනි 08 දිනැති අංක 11/2009 චක්‍රලේඛයේ 03 ඡේදයේ (I) හා (II) වගන්තිය හා 2011 ජුනි 14 දිනැති අංක විවැ/චක්‍රලේඛ/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි අංක 02 | පවත්වා නොතිබුණි. |
| ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | රජයේ නිල නිවාස ලේඛනය | මු.රෙ. 445(2) | පවත්වා නොතිබුණි. |

(ආ) විගණන සාක්ෂි නොවීම

---------------------------

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති ලිපිගොනු 24 ක් විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා, විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කළ නොහැකි විය.

(ඇ) විසර්ජන ගිණුම

------------------

(i) මුළු ප්‍රතිපාදනය හා වියදම.

----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 680,358,340 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය වර්ෂය අවසාන වන විට ඉන් රු. 664,011,601 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 16,346,739 ක් හෙවත් සියයට 2.4 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 273,608,340 | 260,462,068 | 13,146,272 | 4.8 |
| මූලධන | 406,750,000 | 403,549,533 | 3,200,467 | 0.8 |
| එකතුව | 680,358,340 | 664,011,601 | 16,346,739 | 2.4 |

(ii) අයවැය විචලනය

--------------------

* එක් වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු. 50,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

* වැය විෂයයන් 7 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 43 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

------------------------------------------------------------------------------------------

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 22 ක් හා දෙපාර්තමේන්තු 19 ක් විසින් එකතුව රු. 1,599,558,403 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු. 746,442,845 ක් හා රු. 568,414,624 ක් වශයෙන් එකතුව රු. 1,314,857,469 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකී ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය පිළිවෙලින් රු. 278,179,828 ක් හා රු. 7,024,688 ක් වශයෙන් එකතුව රු. 285,204,516 ක් හෙවත් ලබාදී තිබුණු ප්‍රතිපාදනයෙන් ඉතිරිය පිළිවෙලින් සියයට 27.15 ත් සියයට 1.22 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

* පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු ප්‍රතිපාදන මුදල ඉක්මවා තථ්‍ය වියදම පිළිවෙලින් රු. 460,008 ක් හා රු. 43,575 ක් වශයෙන් එකතුව රු. 503,583 ක් වැඩිපුර වියදම් කර තිබුණි.

* අමාත්‍යාංශ 10 ක් හා දෙපාර්තමේන්තු 4 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරිමෙන් පසු ඉතිරිය, එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 ත් සියයට 61 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

-----------------------------------------------

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

-------------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 27501 | 30,000,000 | 20,790,171 | 17,000,000 | 18,467,037 | 126,000,000 | 77,688,728 |

මේ සම්බන්ධයෙන් පහත සදහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 27501 දරන අත්තිකාරම් ගිණුම් පිළිබද 2013 දෙසැම්බර් 31 දිනට සැසදුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට අයවීම් හිගහිට තිබුණු ශේෂවල එකතුව රු. 76,229,991 ක් වූ අතර එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) ණය අයකර ගැනීමට පෙර මියගිය නිලධාරියෙකුගෙන් තවදුරටත් අයවිය යුතු රු. 254,645 ක ණය ශේෂය, ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.4 හා 4.4.1 වගන්ති ප්‍රකාරව, ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට තිබුණු මුදලින් අයකර ගැනීමට හෝ එපරිදි අයකර ගැනීමට නොහැකි ප්‍රමාණය, ණයකරුගේ උරුමක්කාරයින්ගෙන් අයකර ගැනීම සදහා නීතිපතිගෙන් උපදෙස් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2012 අගෝස්තු 25 දින විශ්‍රාමගිය, ප්‍රාදේශීය ලේකම්වරයෙකු සහ 2013 අප්‍රේල් 15 දින විශ්‍රාමගිය රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරියෙකුගෙන් පිළිවෙලින් අයවිය යුතු රු. 345,616 ක් හා රු. 146,415 ක ණය ශේෂයන්, ඔවුන් සම්බන්ධයෙන් පැවැත්වෙන විනය පරික්ෂණය හේතුවෙන් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. එහෙත් නිලධාරියෙකුට එරෙහිව පවතින විනය පරික්ෂණයක් හෝ අධිකරණ ක්‍රියාමාර්ගයක්, ණය අයකර ගැනීම සදහා බාධාවක් නොවන බැවින් අදාල ණයකරුවන් වෙතින් ණය අයකර ගැනිමට ක්‍රියාකර නොතිබුණි.

(iv) වැඩ තහනමට ලක්වූ නිලධාරින් 05 දෙනෙකුගෙන් අය කරගත යුතු එකතුව රු. 1,238,257 ක් වූ ණය ශේෂයක් සැසදුම් ප්‍රකාශය සමග ඉදිරිපත් කර තිබුණු අතර, එම ණය ශේෂය තුළ අවුරුදු 7 ට වැඩි රු. 156,999 ක් වූ ණය ශේෂයක්ද, අවුරුදු 5 ට වැඩි රු. 62,710 ක් වූ ණය ශේෂ 2 ක්ද, අවුරුදු 03 ට වැඩි රු. 1,018,548 ක් වූ ණය ශේෂ 2 ක්ද පවතින බව නිරික්ෂණය විය. වැඩ තහනමට ලක්වූ එම නිලධාරින්ට අදාල නඩු විභාග වෙමින් පවතින අතර එම නඩු අවසන් වන තෙක් නොසිට අදාල ණයකරුවන් වෙතින් හිග ණය ශේෂ අයකර ගැනීමට හෝ එලෙස ණයකරුවන්ගෙන් අයකර ගත නොහැකි අවස්ථාවලදී, ආයතන සංග්‍රහයේ XXIVපරිච්ඡේදයේ 4.5 හෝ 4.6 උප වගන්ති ප්‍රකාරව කටයුතු කළයුතු වුවත් එලෙස ක්‍රියා කර නොතිබුණි.

(ඉ) පොදු තැන්පත් ගිණුම

------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට අංක 6003/0/0/51/0/0 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 174,434,454 ක් වූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශයට අනුව 2013 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 174,434,454 ක් වුවද, කෝවල ශේෂ ලැයිස්තු අනුව එය රු. 174,272,894 ක් වූයෙන් රු. 161,560 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.149,894,821 ක් වුවද, එම කාර්යාලය විසින් නඩත්තු කරන ලද පොදු තැන්පත් ලේඛනය (පොදු ආකෘති පත්‍ර 69) අනුව එදිනට එම ශේෂවල එකතු වටිනාකම රු. 124,997,679 ක් වූයෙන් රු. 24,897,142 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

(iii) 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 ක කාලය ඉක්මවූ රු. 10,617,740 ක් වූ තැන්පතු ශේෂ 92 ක් සම්බන්ධයෙන්, මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ආයතනය | තැන්පතු ප්‍රමාණය | කාලය ඉක්මවූ තැන්පතු වටිනාකම |
|---|---|---|
| | | රු. |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 47 | 8,843,802 |
| මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 04 | 246,207 |
| ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 05 | 13,795 |
| ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 07 | 392,617 |
| හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 29 | 1,121,319 |
| | 92 | 10,617,740 |

1.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

-----------------------------------------

1.6.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා අරමුණු 04 ක් 2013 සංයුක්ත සැලැස්ම මගින් ඉදිරිපත් කර තිබුණි. කාර්යය මණ්ඩලයේ සහ මහජනතාවගේ භාෂාමය සන්නිවේදන තත්ත්වය වැඩිදියුණු කිරීම, දිස්ත්‍රික්කයේ රාජ්‍ය සේවා තත්ත්වය කාර්යක්ෂම හා ඵලදායී බවට පත්කිරීම, තොරතුරු තාක්ෂණය භාවිත කිරීමේ හැකියාවක් වැඩි දියුණු කිරීම සහ කාර්ය මණ්ඩලයේ අන්‍යෝන්‍ය සුහදතාවය වැඩිදියුණු කිරීම, එම අරමුණු ලෙස දක්වා තිබුණු නමුත් එම අරමුණු සමාලෝචිත වර්ෂය තුළදී සාක්ෂාත් කරගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

1.7 වත්කම් කළමනාකරණය

----------------------------

(අ) නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

-------------------------------------------

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌණ උපයෝජිතව පැවති බව නියැදි විගණන පරික්ෂණවලදී නිරික්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌණ උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| i. | ගොඩනැගිලි | 03 | අවුරුදු 1 ට වැඩි |
| ii | මෝටර් වාහන | 05 | අවුරුදු 1 ත් 5 ත් අතර |
| iii. | යන්ත්‍ර සූත්‍ර | 10 | අවුරුදු 2 ට වැඩි |
| iv. | වෙනත් වත්කම් | 69 | අවුරුදු 1 ත් 7 ත් අතර |

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම
-----------------------------------------
පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිල නිවාස හා වාහන පිළිබඳව සමාලෝචිත වර්ෂයේ හා පූර්ව වර්ෂවලදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයකට ලක්කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා වලින් පෙන්වා දී තිබුණු අතිරික්තතා ඌණතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 හි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර තිබුණද, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථාවර වත්කම් පිළිබඳව සහ දිඹුලාගල හා හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගබඩා තොග පිළිබඳව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. එසේම මැදිරිගිරිය, ඇලහැර, දිඹුලාගල හා හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින වෙනත් භාණ්ඩ සම්බන්ධයෙන්ද භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

---------------------------------------------

හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 01 දරන නිවාසය 2008 මාර්තු 12 දින සිට ගිවිසුම් කාලය වසරින් වසර දීර්ඝ කරමින් වසර 5 කට අධික කාලයක් තිස්සේ, මින්නේරිය යුධ හමුදාවේ පාබල පුහුණු මධ්‍යස්ථානයේ සිවිල් ආරක්ෂක නිලධාරින්ගේ රාජකාරි හා පරිපාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා ලබාදී තිබුණු අතර අවසාන ගිවිසුමේ කාලය 2013 සැප්තැම්බර් 10 දිනෙන් අවසන් වී තිබුණි. එහෙත් ඊට පසු ගිවිසුම් කාලය දීර්ඝ කර නොතිබුණු අතර 2014 මැයි මාසය අවසන් වන විටත් ඉහත රජයේ නිවාසය, හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

1.8 අනුකූල නොවීම්

-------------------

නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

-------------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසි වල විධි විධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | ----------------------------- | ---------- | ------------------- |
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>-------------------------- | | |
| (i) | xix පරිච්ඡේදයේ 6 වගන්තිය | - | කිසියම් තනතුරකට වෙන් නොකරන ලද හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 13 ඒ දරන රජයේ නිවාසයද, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ |

| | | | |
|---|---|---|---|
| | | | නිවාස 03 ක් හා තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාසයක් බදු ගිවිසුම් වලට එලඹීමකින් තොරව නිලධාරින් වෙත පදිංචිය සදහා වෙන්කර දී තිබුණි. |
| (ii) | xix පරිච්ඡේදයේ 9 වගන්තිය | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් පොදු සේවා නිවාසවල බදු කාල සීමාව වසර 5 ඉක්මවා දීර්ඝ කාලයක් තිස්සේ පදිංචි වී සිටින නිලධාරින් 08 දෙනෙකු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>----------------------------- | | |
| (i) | මු.රෙ. 104(4) | - | පරික්ෂණයෙන් පසු අලාභ හානිය සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාව ඉදිරිපත් කළයුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අංක 251-3556 රථයේ 2013 අගෝස්තු 24 දින සිදුවූ අනතුරට අදාල පූර්ණ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මු.රෙ. 142(1) | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ආපන ශාලාවේ රු. 4,000 ක මාසික කුලී ආදායම, වර්ෂ ගණනාවක සිටම රජයේ ආදායමක් ලෙස නොසලකා, නීත්‍යානුකූල පදනමක් නොමැතිව පවත්වාගෙන යනු ලබන, සුභ සාධක සංගමයේ ආදායක් ලෙස ගනු ලබන බව නිරික්ෂණය විය. |
| (iii) | මු.රෙ. 272 | - | ගෙවූ සියළුම වවුචර්, ඒවායේ අනුක්‍රමික අංක අනුව පිළියෙළ කොට ඉදිරිපත් කළයුතු වුවත්, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ගෙවීම් වවුචර් අනුක්‍රමික අංක අනුව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. |
| (iv) | මු.රෙ. 371(2) | 83,500 | තත්කාර්ය අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවත්, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඊට පටහැනිව අවස්ථා 8 කදී, විවිධ කාර්යයන් සඳහා නිලධාරින් සඳහා ලබාදී තිබුණු අත්තිකාරම් නැවත පියවීමේදී, මාස 1 ½ සිට මාස 8 ½ දක්වා කාල ප්‍රමාදයක් සහිතව පියවා තිබුණි. |
| (v) | මු.රෙ. 388 හා 389 | 13,990,235 | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2013 හා 2014 වර්ෂයන්හි චෙක්පත් නිකුත් කිරිමේ ලේඛනයට අනුව, චෙක්පත් 148 ක් සම්බන්ධයෙන් චෙක්පත් භාරගත් බවට හෝ ලියාපදිංචි තැපෑලෙන් යවන ලද බවට කිසිදු අත්සනක් හෝ සටහනක් ලේඛනයේ සටහන් කර නොතිබුණි. |

(vi) මු.රෙ. 1646 - දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ, සෑම මසක් අවසන් වීමෙන් පසු ඊළග මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත යැවිය යුතු වුවද, ඇලහැර හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අයත් වාහනවල සහ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක NP-PA-4981 දරන සංචිත වාහනයේ ධාවන සටහන් හා මාසික සාරාංශද එලෙස විගණකාධිපති වෙත එවා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය
--------------------------------

(i) 2.11.1(අ) හා (ආ) මාර්ගෝපදේශය - ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සදහා නියම කරනු ලබන දිනය, වේලාව හා ස්ථානය පිළිබදව සභාපතිවරයා විමසා, කමිටුවේ ලේකම්වරයා විසින් ප්‍රසම්පාදන කාල සටහනකට අනුකූලව නියම කළයුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) 2.11.3 මාර්ගෝපදේශය - කමිටු රැස්වීම්වල වාර්තා, ප්‍රසම්පාදන අත් පොතේ අඩංගු නිශ්චිත ආකෘතියකට අනුව වාර්තා ගත කළයුතු අතර එය පැමිණ සිටින සාමාජිකයින් විසින් සහතික කළයුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 වර්ෂයට අදාල කමිටු රැස්වීම් වාර්තාවල, එලෙස සාමාජිකයින් විසින් සහතික නොකළ අවස්ථා 9 ක් නිරික්ෂණය විය.

(iii) 2.14.1 මාර්ගෝපදේශා - රු. 500,000 ට වඩා අඩු භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට පෙර වෙළඳපොල මිල සැදහුම් ක්‍රමයට අනුව, කලින් දැනුම් දුන් දිනක මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැදවීමෙන් සහ ප්‍රසිද්ධ ලංසු විවෘත කිරීමක් තුලින්, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සිදුකළ යුතු වුවත්, ඊට පටහැනිව ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මිල සැදැහුම් 1 - 3 ත් අතර ප්‍රමාණයක් ලැබී ඇති අවස්ථා 8 කදී ද, හිගුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මිල සැදහුම් 01 -02 ත් අතර ප්‍රමාණයක් ලැබී ඇති අවස්ථා 02 කදීද, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මිල ගණන් කැදවීමකින් තොරව අවස්ථා 31 කදී හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මිල සැදහුම් 01 - 02 ත් අතර ප්‍රමාණයක් ලැබී ඇති අවස්ථා 03 කදී, එම මිල සැදහුම් පදනම් කරගෙන ප්‍රසම්පාදන තීරණ ලබාදී තිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඈ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ හා ලිපි<br>-------------------------------- | | |
| (i) | 1987 ජනවාරි 05 දිනැති අංක කේ. 887 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය | - | ආර්ථික කුලියක් අයකර ගැනීමට ලේකම්වරයාගේ අවසරය ලබාගත යුතු අතර එම ආර්ථික කුලිය වලංගු වන්නේ වර්ෂයක කාල සීමාවකට වුවද, 2011 වර්ෂයේ තක්සේරු වාර්තාවක් පදනම් කරගෙන, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 01 හා 02 දරන ලිපිකරු නිවාස සඳහා රු. 975 බැගින් ආර්ථික කුලියක් සමාලෝචිත වර්ෂයේදි අයකරනු ලබන බව නිරික්ෂණය විය. |
| (ii) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ එච්ඒ/ඩීඒ/12/27 හා 2006 මාර්තු 21 දිනැති ලිපිය සහ සමාංක දරන 2009 ජුනි 12 දිනැති ලිපිය | - | සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් තම රාජකාරි ස්ථානයට අයත් නිල නිවාසයේ අනිවාර්යයෙන්ම පදිංචි විය යුතු අතර, ප්‍රාදේශීය ලේකම්වරුන් තම නිල නිවාසයෙහි පදිංචි නොවන්නේ නම්, ඊට පිළිගත හැකි සාධාරණ හේතු ඉදිරිපත් කර, අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියක් ලබා ගැනීමෙන් පසු, සුදුසු නිලධාරියෙකුගේ පදිංචිය සඳහා එම නිල නිවාසය භාරදී, ආයතන සංග්‍රහය ප්‍රකාරව, එම පදිංචි නිලධාරියාගෙන් නිවාස කුලී අයකළ යුතු වුවත්, එලෙස කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ<br>------------------------- | | |
| (i) | 2001 පෙබරවාරි 06 දිනැති අංක 393 දරන චක්‍රලේඛයේ 4.2 ඡේදය | 53,700 | පුද්ගලික ගමන් සඳහා නිල වාහන පාවිච්චි කිරීමට හිමිකම් ඇති නිලධාරීන්, රජයේ ඇණවුම් මත ඉන්ධන ලබාගැනීම නොකල යුතු අතර සිය සාමාන්‍ය රාජකාරියෙන් බැහැර විශේෂ රාජකාරියක් සඳහා නිල වාහනය භාවිතා කිරීමට සිදුවන අවස්ථාවලදී, ඒ වෙනුවෙන් සත්‍ය ලෙස වැය වූ ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කරගත හැකි වුවද, ඊට පටහැනිව දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල වාහනය සඳහා වර්ෂය තුළ අවස්ථා 21 කදී ඉන්ධන ලීටර් 450 ක්, රජයේ ඇණවුම් මත ලබාගෙන තිබුණි. |
| (ii) | 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පීඑෆ් - 437 දරන - චක්‍රලේඛය | - | සියළුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන තම ආයතන අවශ්‍යතාවයන් අනුව මෝටර් රථ රක්ෂණ ආවරණයක් ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් සලසා ගත යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක 252-9909 හා අංක 32-2192 දරන වාහන සඳහා රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | 2010 මැයි 22 දිනැති අංක පීඑෆ් - 443 දරන චක්‍රලේඛය | 597,725 | රාජ්‍ය ආයතන තම ඉන්ධන අවශ්‍යතා ලබාගැනීමේදී, සමුපකාර සමිති සතු ඉන්ධන පිරවුම්හල් වලට ප්‍රමුඛතාවය ලබාදිය යුතු අතර අවශ්‍යතාවය අනුව, අදාල සමුපකාර සමිති වෙත තැන්පතු මුදලක් තබා, එම තැන්පත් මුදලේ ප්‍රමාණය නොඉක්මවීමේ පදනම මත හෝ අත්පිට මුදල් ගෙවා සිය ඉන්ධන අවශ්‍යතාවයන් සපුරා ගත යුතු වුවත්, ඊට පටහැනිව දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ සියළුම ඉන්ධන අවශ්‍යතාවයන් පෞද්ගලික ඉන්ධන පිරවුම්හලක් වෙතින් ලබාගෙන තිබුණි. |
| (ඊ) | ජාතික අයවැය චක්‍රලේඛ<br>---------------------------<br>2013 මාර්තු 28 දිනැති අංක 1/2013 දරන විමධ්‍යගත අයවැය චක්‍රලේඛය | 218,805 | 2013 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ මෙම චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සේවක සුභ සාධක සමිති 7 ක් සඳහා උපකරණ ලබාදී තිබුණි. |
| (උ) | වෙනත් චක්‍රලේඛ<br>-------------------- | | |
| | ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ 2008 පෙබරවාරි 13 දිනැති අංක 2008/11 දරන චක්‍රලේඛය | - | (I) වයස මාස 24 ට වැඩි සහ මාස 60 ට අඩු බාණ්ඩයේ දරුවන් සඳහා පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන හරහා කිරි වීදුරුව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී, ඇලහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෙර පාසල් 52 න් පෙර පාසල් 13 ක් සඳහාද තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෙර පාසල් 69 න් පෙර පාසල් 18 ක් සඳහාද දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෙර පාසල් 75 න් පෙර පාසල් 60 ක් සඳහාද මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.<br><br>(II) ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක පෙර පාසල් 30 ක ළමුන් 1041 ක් සඳහා සමාලෝචිත වසරේ මුල මාස 9 තුළ කිරි වීදුරුව වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණු අතර වර්ෂයේ අවසන් මාස 3 තුළ පෙර පාසල් 15 ක ළමුන් 560 ක් සඳහා මෙම ප්‍රතිලාභය ලැබී නොතිබුණි. |

## 1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

----------------------------------------

ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

---------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සදහන් ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අතහැර දමා තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2013 දෙසැම්බර් 31 දින වන විට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| දැයට කිරුළ සංවර්ධන වැඩසටහන 2013 යටතේ ව්‍යායාම මං තීරුව ඉදිකිරිම | 26,505,983 | 2013.02.05 | 4,456,324 | ආර්ථික සංවර්ධන/සෞඛ්‍ය අමාත්‍යවරුන්ගේ තීරණයක් මත |

(ආ) ව්‍යාපෘති ඉටුකිරිමේ ප්‍රමාදයන්

----------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සදහන් ව්‍යාපෘති ඉටුකිරිමේ ප්‍රමාදයන් නිරික්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත මුදල (වැට් රහිත) | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | 2013.12.31 දිනට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව වැසිකිලි පද්ධතිය ඉදිකිරිම | 2,155,226 | 2013.11.06 | 2013.12.31 | 274,582 | ඉදිරිපත් කර නැත |
| රාජකීය මධ්‍ය මහා විද්‍යාලයේ ප්‍රධාන ශාලාව නවීකරණය | 29,220,274 | 2013.09.06 | 2013.06.05 | 3,600,000 | කාලය පැවතීම |
| ගිරිතලේ මහා විද්‍යාලයේ ශ්‍රවනාගාරය ඉදිකිරිම | 44,406,308 | 2013.12.30 | 2014.06.30 | 500,209 | ගිවිසුම් කාලය 2014.06.30 වීම |
| රාජකීය මධ්‍ය මහා විද්‍යාලයේ තනි මහල් පංති කාමර ගොඩනැගිල්ල | 10,719,961 | 2013.11.11 | 2014.01.31 | 3,171,189 | ගිවිසුම් කාලය 2014.01.31 වීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| සතිපොල ඉදි කිරිම - හිගුරක්ගොඩ | 20,000,000 | 2013.06.12 | 2013.12.12 | 4,407,618 | වැසි සහිත කාළගුණික තත්වය හා මෙම ව්‍යාපෘති ප්‍රාදේශීය සභාව මගින් ඉටු කරන ඒවා වන අතර එම සභාවල පරිපාලනයේ ඇති වූ ගැටළු හේතුවිය. |
| සතිපොල ඉදි කිරිම - ලංකාපුර | 20,000,000 | 2013.06.12 | 2013.12.12 | 12,068,629 | |
| සතිපොල ඉදි කිරිම - තමන්කඩුව | 20,000,000 | 2013.06.12 | 2013.12.12 | 5,459,661 | |
| සතිපොල ඉදි කිරිම - වැලිකන්ද | 20,000,000 | 2013.06.10 | 2013.12.10 | 7,187,728 | |
| සතිපොල ඉදි කිරිම - මැදිරිගිරිය | 20,000,000 | 2013.06.24 | 2013.12.24 | 13,463,566 | |
| සතිපොල ඉදි කිරිම - ඇලහැර | 20,000,000 | 2013.06.13 | 2013.12.13 | 5,241,879 | |
| මහසෙන් මන්දිරය - හිගුරක්ගොඩ | 40,107,328 | 2013.09.05 | 2014.09.05 | 15,662.473 | ව්‍යාපෘති නිම කිරිම සඳහා වසරක්වත් ගත වන බැවින් |
| ධවල මන්දිරය පොළොන්නරුව | 40,101,843 | 2013.09.20 | 2014.09.20 | 8,541,983 | |

## 1.10 කාර්ය සාධනය

-----------------

සංයුක්ත සැලැස්ම හා 2013 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම පරික්ෂා කිරිමේදී, සංයුක්ත සැලැස්මට අනුකූලව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර, පිළියෙල කර ඇති ක්‍රියාකාරි සැලැස්මෙහි අපේක්ෂිත පරමාර්ථ ඉටුකර ගැනීමට අදාල කාර්යයන් හෙළිදරව් කර නොතිබීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ ඇගයීමක් සිදු කිරිමට නොහැකි විය.

## 1.11 අවිධිමත් ගණුදෙනු

----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගණුදෙනු විධිමත් බවින් තොර විය. නිරික්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) 2013 ගංවතුර ආපදා තත්ත්වය යටතේ, කිරිමැටිය කනිෂ්ඨ විද්‍යාලයේ පිහිටුවා තිබුණු සුභ සාධක මධ්‍යස්ථානයට, පිසූ ආහාර ලබාදීම සඳහා ලබාගත් එළවළු හා ද්‍රව්‍ය වෙනුවෙන්, හිගුරක්ගොඩ නාමල් වෙළඳ සැල වෙත 2013 මාර්තු 06 දින, වවුචර් අංක 3/16 මගින් රු. 347,250 ක් ගෙවා තිබුණි. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයෙන් ලබාගත් මිල ගණන් වලට අනුව රු. 38,000 ක් වටිනා එළවළු තොගය සඳහා රු. 98,000 ක් ගෙවා ඇති අතර, ඒ අනුව රු. 60,000 ක් වැඩිපුර ගෙවීම් කර

තිබුණි. එමෙන්ම තොග වශයෙන් මිලදී ගත් මෙම එළවළු සඳහා වූ මිල ගණන්, හිගුරක්ගොඩ ප්‍රදේශයේදී මෙතරම් ඉහළ මිලක් ගත නොහැකි බව නිරීක්ෂණය විය.

(ආ) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදි වැඩමුළු 04ක් පවත්වා තිබුණි. ඒ සඳහා නිලධාරීන් 295ක් සහභාගී වී තිබුණත් ඇස්තමේන්තුව අනුව 465කට අදාලව වියදම් කර තිබුණි. ඒ අනුව සහභාගී නොවූ නිලධාරීන් 170 දෙනෙකු වෙනුවෙන් රු. 18,986 ක් වැය කර තිබුණි.

(ඇ) පැල මිලදී ගැනීම් වලදී ප්‍රසම්පාදන කමිටුවක් පත්කර, එහි නිර්දේශ මත මිල ගෙවීම් සිදුකළ යුතු වුවත්, එලෙස කටයුතු නොකර, පැල මිලදී ගැනීමට තීරණය කරන ලද අවස්ථාවේදී හා පැල මිලදී ගන්නා අවස්ථාවේදීද, එම පැල හොද තත්ත්වයෙන් පවතින්නේද යන්න පිළිබදව කෘෂිකර්ම උපදේශකවරයෙකුගේ නිර්දේශයක් ලබාගැනීමකින් තොරව, දිඹුලාගල කළුකැලේ ප්‍රදේශයේ පිහිටි සුළු පරිමාණයෙන්, අඩු පහසුකම් යටතේ පවත්වාගෙන යන, කුඩා පැල තවානක් වෙතින් ගම්මිරිස්, කොස් හා නාරං පැල 56680 ක් රු. 2,198,600 ක මුදලකට ලබාගෙන තිබුණු අතර මෙම මුදලින් රු. 389,000 ක වටිනාකමක් සහිත චෙක්පත් දෙකක්, පැල තවානේ හිමිකරු නොවන බාහිර පුද්ගලයෙකු වෙත ගෙවා තිබුණි. ක්ෂේත්‍රයේ වගාකිරිම සදහා බෙදාදී ඇති ගම්මිරිස් පැල, බෙදාදෙන අවස්ථාවේදීද, නියමිත ප්‍රමිතියට නොතිබුණු බැවින් හා බොහෝමයක් පැල, ලෙඩ රෝග වලට ගොදුරුවී තිබිම හේතුවෙන්ද, එම පැල වගාකර මාසයක් ගතවීමටත් පෙර ඒවා විනාශවීම හේතුවෙන්ද, ක්ෂේත්‍රයේ වගාකිරිම සඳහා බෙදාදී ඇති ගම්මිරිස් පැල වලින් 10% කට අඩු ප්‍රමාණයක් පමණක් ඉතිරිවී තිබුණු බව විගණන ක්ෂේත්‍ර පරික්ෂාවේදී අනාවරණය විය.

(ඈ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබෙන අලි වෙඩි ප්‍රමාණය ලැබීම් ලේඛනයක සටහන් කර නොතිබුණු අතර නිකුත් කිරීම්ද අවිධිමත් ආකාරයකින් පැවතුණි. ලැබුණු අලිවෙඩි කිසිදු ආරක්ෂාවකින් තොරව ගබඩාවේ දමා තිබුණු අතර පුපුරණ ද්‍රව්‍යයක් වන අලි වෙඩි ගබඩා කර තැබිම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ආරක්ෂිත ක්‍රමවේදයක්ද අනුගමනය කර නොමැති බවද නිරික්ෂණය විය.

**1.12 පාඩු හා හානි**

--------------

(අ) රජය සතු දේපළ නොසැලකිලිමත්ව හා වංචාසහගත ලෙස භාවිතා කිරීම හේතුවෙන් අංක 31 ශ්‍රී 141 ජීප් රථය සඳහා පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගෙවීමට සිදුවූ රු. 373,200 ක අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින් ලෙස නමකර තිබුණු නිලධාරින් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 105 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අස්ථානගතවී ඇති වටිනාකම රු. 55,920 ක් වූ අලි වෙඩි 699 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 105(1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු වාහනයක් අනතුරට පත්වී තිබුණු අතර එය අළුත්වැඩියා කිරිම සඳහා රු. 433,098 ක් වැයකර තිබුණි. මේ සඳහා රක්ෂණ ආයතනය විසින් හානි ප්‍රතිපූර්ණය කිරිම සඳහා රු. 320,729 ක් ලබාදී තිබුණි. ඒ අනුව රු. 112,369 ක් වූ අලාභහානිය අයකර ගැනීමට හෝ කපා හැරීමට මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) 2010 ජුලි 25 දින මාතලේ මහනුවර මාර්ගයේදි සිදුවූ රිය අනතුර හේතුවෙන්, අනතුරට පත් වූ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථය සඳහා රක්ෂණ ආවරණයක් ලබා ගෙන නොතිබුණු අතර එම රථය පැදවූ ප්‍රාදේශීය ලේකම් විසින් එහි අලාභයේ වටිනාකම ලෙස රු. 60,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. එහෙත් අනතුර සිදුවී මේ වන විට වර්ෂ 4 ½ ක් ගතවී ඇතත්, ඊට අදාලව මු.රෙ.104(4) ප්‍රකාරව අලාභානි සම්බන්ධයෙන් වන අවසන් වාර්තාව නිකුත් කර නොතිබුණු අතර එම වාහනය කිසිදු අලුත්වැඩියාවකින් තොරව දිරාපත් වෙමින් පැවතුණි.

## 1.13 කළමනාකරණ දූර්වලතා

---------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමේදී, එය පිටපත් 03 කින් යුතුව අත්සන් කළයුතු අතර ඉන් එක් පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ අත්සන් කළ කිසිදු ගිවිසුමක පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) එක් එක් මාසය අවසානයේදී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළග මාසයේ 15 වැනි දිනට පෙර, බැංකු සැසඳුම් පිළියෙල කර, එහි පිටපතක් විගණකාධිපති වෙත එවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එලෙස කටයුතු කර නොතිබුණි.

(ඇ) තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලඅයේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කරනු ලබන ඇගිලි සලකුණු යන්ත්‍රයද, කාර්යාල නිලධාරින්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා භාවිතා කරන ලද පැමිණීමේ ලේඛනය හා , නිවාඩු ලේඛනයද නිසි අධීක්ෂණ මාණ්ඩලික නිලධාරින්ගේ පාලනයක් යටතේ නඩත්තු නොවන බව නිරික්ෂණය විය.

(ඇ) ඇලහැර හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිවාඩු ලේඛනය පරික්ෂාවේදී සමාලෝචිත වර්ෂය තුල කිසිදු නිවාඩුවක් ලබා නොගත් නිලධාරින් 12 දෙනෙකු නිරික්ෂණය වූ අතර එම සියළුම නිලධාරින් ක්ෂේත්‍ර රාජකාරියේ නියැලෙන නිලධාරින් බව නිරික්ෂණය විය. මෙම නිලධාරින්ගේ නිවාඩු, ඉදිරි වැඩසටහන් හා මාසික කළ වැඩසටහන් නිසි පරිදි අධීක්ෂණ නිලධාරියෙකු මාර්ගයෙන් පරික්ෂාවකට ලක් නොවන බවද එම ක්ෂේත්‍ර නිලධාරින්ට සමීපව අධීක්ෂණය කිරිම සම්බන්ධව විධිමත් යාන්ත්‍රණයක් සකස් වී නොමැති බවද නිරික්ෂණය විය.

(ඉ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 5 ක් හා සාද නිවාස 2 ක් නවිකරණය කර ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාසවල ඉඩම් සඳහා හිමිකම් ඔප්පු ලබාගැනීමටද ක්‍රියාකර නොතිබුණි.

(ඊ) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සමෘද්ධි බැංකු සංගම් 05 ක් විසින් සමෘද්ධිලාභීන් වෙත ලබාදී තිබුණු විවිධ ණය වර්ග අයකර ගැනිම් පිළිබද පසුවිපරම් කිරීමේ ක්‍රියාවලිය දුර්වල තත්ත්වයක පැවති අතර ලබාදුන් විවිධ ණය වලින් 2014 ඔක්තෝබර් 11 දිනට රු. 18,844,778 ක බොල් ණය ප්‍රමාණයක් ඇතිවි තිබුණි.

(උ) රජයේ අරමුදල් මගින් රු. 292,785 ක් වැයකර වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රාජකාරි කටයුතු සඳහා 2006 දෙසැම්බර් 28 දින මිලදී ගත් යතුරුපැදි 3 ක් නඩත්තු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු. 63,033 ක වියදමක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන වලින් දරා තිබුණු නමුත්, එම යතුරුපැදි රාජකාරී කටයුතු සඳහා නිලධාරින් වෙත නිකුත් කිරිමේදි, විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු අතර, එම යතුරුපැදි පාලනය සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන පාලනය, දුර්වල තත්ත්වයක පැවැති බව නිරික්ෂණය විය.

## 1.14 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2013 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබද තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්ාපඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. | ජ්‍යොෂ්ඨ මට්ටම | 33 | 28 | 05 |
| ii. | තෘතීයික මට්ටම | 20 | 10 | 10 |
| iii. | ද්විතීයික මට්ටම | 593 | 425 | 168 |
| iv. | ප්‍රාථමික මට්ටම | 100 | 77 | 23 |
| | එකතුව | 746 | 540 | 206 |

පහත සදහන් නිරික්ෂණය කරනු ලැබේ.

කාර්යය මණ්ඩල උපයෝජනය පිළිබඳ සිදු කරන ලද සෝදිසි පරික්ෂාවේදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 05 දෙනෙකුගේද, තෘතීයික මට්ටමේ නිලධාරින් 10 දෙනෙකුගේද, ද්විතීයික මට්ටමේ නිලධාරීන් 168 දෙනෙකුගේද, ප්‍රාථමික මට්ටමේ නිලධාරින් 23 දෙනෙකුගේද වශයෙන් පැවති පුරප්පාඩු 206 පිරවීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ එක් තනතුරක් පමණක් මේ වන විට සම්පූර්ණ කර ඇති බව දිස්ත්‍රික් ලේකම් විසින් දන්වා තිබුණි.